# ICBS 70

## විනයප්‍රතිපත්තිධර භික්ෂු සමාජයක් පිහිටුවීමේ අරමුණින් සම්පාදිත *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිසෙහි* භාවිත භාෂා ශෛලිය පිළිබඳ විමසුමක්

**නදීකා සඳමාලි පීරිස්**
*සිංහල අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය*
*nadeeka.pieris@yahoo.com*

ක්‍රි. පූ. තෙවන සියවසෙහි මහින්දාගමනයෙන් අභ්‍යුත්ථානය ලත් සිංහල සාහිත්‍යය එකල බෞද්ධ මුහුණුවරක් ගෙන ඇත. පූර්ව අවධියෙහි බෞද්ධ ධර්මය ඇතුළත් පාලි ග්‍රන්ථ රචනා වූ අතර, පශ්චාත් කාලීන ව ඒවා සිංහල භාෂාවට පෙරළූ බව *මැදුම් සඟි* සහ *සංයුත් සඟි අටුවා* ලියූ බුදුගොස් තෙරණුවෝ  සඳහන් කරති. *'මගධ බසින් වැටෙමින් ආ බුදු කැලි අටුවා හෙළදිව ඇජුරෝ හෙළ බසින් තුබූහ.'* යන *ධම්පියා අටුවා ගැටපද* පාඨයෙන් එය ප්‍රතීයමාන වෙයි. අනුරාධපුර යුගයේ රචිත *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිස* මේ මඟෙහි ම නො ගිය ද, තත්කාලීන භික්ෂු සමාජය සදාචාර සම්පන්න විනය ගරුක භික්ෂු සමාජයක් කිරීම උදෙසා රචිත විනය නීති සංග්‍රහයක් ලෙස හැඳින්විය හැකිය. *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිස* කොටස් දෙකකින් සමන්විතය. ප්‍රථම ව උපසම්පදා භික්ෂූන් උදෙසා විනය නීති ද, දෙවනු ව ඒවා සවිස්තරාත්මක ව ද ඉදිරිපත් කර ඇත. සිංහල භාෂාවෙන් රචිත ප්‍රථම විනය නීති සංග්‍රහය වන මෙය සමස්ත විනය පිටකය අලළා රචනා වූ නමුත් කරුණු සැකෙවින් දැක්වීම සුවිශේෂය. එය *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිස* ආරම්භක වැකි මගින් හෙළිවෙයි. මෙහි *සිවු පරිජි, සත් සඟ වෙසෙස්, තුදුස් නිසැගි, එක් සාළිස් පචිති, පකිණ්ණක* යන චාරිත්‍ර ද ඇදුරුවත්, තෙරවත් හා පොහෝ පවුරුණු විධි ආදී චාරිත්‍ර ද *සචිත්තක, අචිත්තක විභාග* ද අන්තර්ගත ව ඇත. මෙලෙස භික්ෂු විනය ශික්ෂා සංගෘහිත *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිසෙහි* භාෂා ශෛලිය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර සමකාලීන සාහිත්‍ය ග්‍රන්ථවලට සාපේක්ෂ ව සිංහල භාෂාවේ පරිණාමීය ලක්ෂණ එයින් නිරූපණය වූයේ කෙසේ ද ? යන්න පිළිබඳ ව ද පරීක්ෂා කෙරිණි. *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිසෙහි* භාෂා ශෛලිය ව්‍යක්ත වුව ද සරල හා සුබනම්‍ය වේ. දිගු වැකි පැවතිය ද විනය නීති සංග්‍රහයක් හෙයින් භික්ෂූන් වහන්සේලාගේ ධාරණාව පිණිස බොහෝ තන්හි සැකෙවින් කරුණු දැක්වී ය. *ධම්පියා අටුවා ගැටපදය* හා සමකාලීන කෘතියක් හෙයින් එහි අන්තර්ගත ව්‍යාඛ්‍යානමය ලක්ෂණ හා ඇතැම් වචන මෙම කෘතියෙන් හමුවූව ද, සකු වදන් බහුල බව දක්නට නො වී ය. පාලි වචන සඳහා හුදු හෙළ වදන් භාවිත කිරීම, ඒ වන විට සිංහල භාෂාවෙහි භාවිත නො වූ වචන රැසක් යොදා ගැනීම, විභක්ති සූචක පද භාවිතය, හලන්ත වචන භාවිතය, දීර්ඝාක්ෂර භාවිතය, ඇ කාරය හා සඤ්ඤක අක්ෂර යොදා ගැනීම යනාදි භාෂා ලක්ෂණ දක්නට ලැබිණි. මෙම භාෂා ලක්ෂණවලට අනුව මධ්‍යතන යුගයේ රචිත *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිසෙහි* භාෂා ශෛලිය ප්‍රාකෘත හා පුරාතන යුගයේ භාෂා ලක්ෂණ නො ව, තත් යුගයේ  ම ව්‍යවහාර භාෂා ලක්ෂණයන්ගෙන් සමූපේත බව නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පදඃ** විනය සාහිත්‍යය, *සිඛ වළඳ සහ සිඛ වළඳ විනිස*, භාෂා ශෛලිය, භික්ෂු විනය